# වෙනස්වන සමාජයේ භික්ෂුවට ලැබෙන තැන*

ආචාර්ය හැවන්පොළ රතනසාර හිමි

**සමාජය:**

ජීවිතයක් පවත්වාගෙන යෑමට අවශ්‍යයෙන්ම උවමනාකරන කෑම්-පීම්, ඇඳුම්-පැළඳුම්, ගෙවල්-දොරවල් හා සිරිත්-විරිත් බොහෝ සෙයින් ඒකීය ස්වරූපයකින් පවත්වාගෙන යන මිනිස් සංහතිය මෙහිදී සමාජය යනුවෙන් අදහස් කෙරේ.

පොදු මිනිස් සමාජය තුළ ආගම, භාෂාව, සංස්කෘතිය හා භෞගෝලික වෙනස්කම්ද අනුව වෙන් වෙන් සමාජ කොටස් වශයෙන් හැඩ ගැසුණු සමාජ ඒකක පවත්වාගෙන එනු ලැබේ.

ආගමික රටාවක් තුළ, බෞද්ධ දර්ශනික න්‍යායක් මත ගොඩනැගුණු ශාසනික සම්ප්‍රදය, සමාජවාදී සිද්ධාන්තයක් පදනම්කොට සකස් වූ සමාජ ඒකකයක, අග්‍රගණ්‍ය කොටසක් ලෙස භික්ෂුවට වැදගත් තැනක් ලැබී ඇත.

භික්ෂුවද පොදු සමාජයේ සාමාජිකයකු බව මෙහිදී විශේෂයෙන් සැලකිය යුත්තකි. ගතානුගතිකත්වයෙන් පුද්ගලයා හා සමාජය අනුගමනය කරණ නොගැඹුරු ජීවන රටාව අභිභවනය කොට විමුක්ති මාර්ගයක් ඔස්සේ ආත්ම සුභසිද්ධිය මෙන්ම පරාර්ථ සුභසිද්ධිය කෙරෙහිද ඇප කැප වූ සමාජ ඒකකයක් ලෙස සංවිධාන වූ පිරිසකි භික්ෂු සමාජය. එසේම අවුරුදු 2521 කට ඉහත සමාජයක් තුළ පැවැති සම්ප්‍රදයන් හා දර්ශනික චින්තන ක්‍රමවලින් උද්ගතවුණු අඛණ්ඩ ජීවන ක්‍රමයකට නැඹුරු වූ පිරිසකි, භික්ෂු සමාජය. එපමණක් නොව භික්ෂු සමාජය භින්න රුචික, සංකීර්ණ සමාජයක් ඇතුලත ජීවත්වන අතර, එහි පොදු ලක්ෂණ කෙරෙහි දර්ශනික දෘෂ්ටිකෝණයකින් විමසා සෙසු සාමාජිකයන්ගේ පොදු ජීවන පිළිවෙතින් මෑත්වූ එහෙත් සමාජය කෙරෙහිද අවධානයක් යොමුකරවමින් එහි බාහිර ආටෝපයට ගොදුරු නොවී සරල ජීවන දර්ශනයක් හා ක්‍රියාමාර්ගයක් කෙරෙහි ඇප කැප වූ පිරිසකි. ධනය, බලය, කීර්තිය හා සැප සම්පත් පිළිබඳ සහජයෙන් මෙන් මිනිසා තුළ ජනිතවන පොදු චින්තන ධාරාවන්හි නිසරු බව හා අයහපත් බව සමාජයට ප්‍රකට කරන සංස්ථාවක් ලෙස භික්ෂුව වසන ආරාමය සකස් කර ඇත. මානව භක්තිය, සමාජ සාධාරණත්වය, මිනිස් ස්වභාවය හා මිනිසාගේ අගය නිර්ණය කෙරෙන මිනුම් දණ්ඩ වනාහි ධනය, බලය, කුලය හා වෙනත් බල පුළුවන්කාරකම් නොවන බවත් එකී පුද්ගල විනය හා සමාජ විනය ඇසුරින් තමතමන් කෙරෙහි වර්ධනය කරගතයුතු ආධ්‍යාත්මික ගුණාංග වැඩි දියුණු කරගැනීම බවත් සමාජයට අවබෝධ කරගත හැකිවන පරිදි බෞද්ධ විහාරස්ථාන ආශ්‍රයෙන් ඒවායෙහි වැඩවසන භික්ෂූන්වහන්සේගේ ජීවන රටාව සකස්වී ඇත.

බුද්ධසමය ව්‍යාප්ත වුණු සෑම රටකම මෙබඳු බෞද්ධ ආරාම හා භික්ෂු ජීවිත ක්‍රමයක් ක්‍රියාත්මක වී ඇත. බෞද්ධ දර්ශනය හා එහි ප්‍රායෝගිකත්වය ක්‍රියාත්මක කිරීමේ සාර්ථකභාවය ඒ ඒ රටවල ඒකාකාරව සිදු වී නැත.

බෞද්ධ චින්තනය, ආරාමික භික්ෂු ජීවිතය, පොදු සමාජය යන කරුණු එකිනෙකට සම්බන්ධව සමාජ ප්‍රගතිය සඳහා ක්‍රියාකාරිත්වයෙන් ඔප් නැගුණු බෞද්ධ රටවල් අතර ශ්‍රී ලංකාවට හිමිවන්නේ අද්විතීය ස්ථානයකි.

ශ්‍රී ලංකා රාජ්‍ය වංසයේ ආරම්භයේ සිට එහි අවසානභාගය තෙක් මෙබඳු සමෝධානික ජීවන රටාවක් තිබුණි. භික්ෂුව හා ආරාමය නඩත්තු කිරීම හා ආරක්ෂා කිරීම රජය සතු වැදගත් යුතුකමක් ලෙස සලකන ලද්දේ හුදෙක් එමගින් සැපයෙන පාරලෞකික සුභසිද්ධියක් සලකාගෙනම නොවේ. විනයගරුක සැහැල්ලු පැවතුම් ඇති සදචාර සම්පන්න ජීවිතයකට හුරුපුරුදු වුනු කරුණා මෛත්‍රී ආදී ගුණධර්ම වලින් පෝෂණය ලැබූ අනලස්ව ස්වකීය ආර්ථික ජීවිතය සාර්ථක කරගැනීමට සමත් අසිරිමත් සමාජයක් පවත්වාගෙන යැමට භික්ෂුව හා ආරාමය නඩත්තු කරගැනීමෙන් මහඟු ප්‍රතිඵල ලැබීම ගැන රජයේ සහ ජනතාව තුළ දැඩි සැලකිල්ලක් තිබුණි.

රජය සහ ආගම අතර මෙබඳු අත්‍යන්ත සම්බන්ධතාවක් පවත්වාගෙන ඒමට හැකිවන අන්දමේ ස්ථිරසාර වැඩපිළිවෙලක් ක්‍රියාත්මක වූයේ දෙවනපෑතිස් මහරජුගේ රාජ්‍ය පාලන සමයෙහි මෙරටට බුදුසමය ගෙන ආ මිහිඳු මහරහතුන් වහන්සේගේ දූරදර්ශී ක්‍රියා කලාපය නිසාය.

සමාජය නිතරම වෙනස්වීම් වලට භාජන වෙයි. එක් ස්ථානයක ඒකාකාරව නොවෙනස්ව පවතින ස්වභාවයක් සමාජයට නැත. පුද්ගලයාගේ ස්වභාවයත් මෙබඳුමයි. සමාජයේ සහ පුද්ගලයා කෙරෙහිද නිබඳව පවත්නා මෙම ස්වභාවධර්මය තත්වාකාරයෙන් ප්‍රකට කෙරෙන දර්ශනයක් බුද්ධ ධර්මයෙන් පිළිබිඹු වෙයි. සචේතනික පුද්ගලයන්ගේ හා ජීවමය තත්වයන් විද්‍යමාන වස්තූන් තුළ පවත්නා වෙනස්වීමේ ස්වභාවය අජීවමය පදර්ථයන් තුළ පවත්නා ස්වභාවයට වඩා වේගවත් වෙයි. වෘක්ෂලතා සහ තිරිසන් සත්ව ලෝකයෙහි පවත්නා වෙනස්කම් වලට වඩා වේගවත් ලෙසත් හේතු යුක්ති අනුව වෙනස්කම් වඩා අර්ථාන්විතව හැඩගස්වා ගැනීමේ ශක්තිය සචේතනික සමාජයට හා පුද්ගලයාට තිබේ. සවිඥාණකව හෙවත් සුපරීක්ෂාකාරීව සොයාබලා පරිසරය හැඩගස්වා ගැනීමේ හැකියාව සමාජයට මෙන්ම පුද්ගලයාට ද තිබේ. මෙම අසාමාන්‍ය හැකියාවන්ගෙන් යුත් පුද්ගලයන්ගෙන් රාශිභූත වුනු සමාජයක් නිතර නිතර හැඩගැසීමට උත්සාහ දරයි. මෙය වූ කලී මිනිස් සමාජය තුළ සහජයෙන් ම ආවේණිකව පවත්නා ලක්ෂණයකි. එහෙයින් ම මිනිසා තම සමාජය තුළ අනුගමනය කරන ක්‍රියාමාර්ග දවසින් දවස සකස් කරගනී. ඔහුගේ ජීවිතය රඳාපවත්වා ගැනීම සඳහා උපයෝගී කරගන්නා ආහාර පාන වර්ග සංකීර්ණ ලෙස සපයා ගනී. ඔහුගේ විළි වසාගැනීම සඳහා උපයෝගී කරගන්නා ඇඳුම්-පැළඳුම් ආදියද විවිධ මෝස්තර වලින් සකස් කරගනී. අවු වැසි ආදී ස්වාභාවික හේතූන්ගෙන් පැමිණෙන උපද්‍රවවලින් හා සොර සතුරන්ගෙන් පීඩා මගහරවා ගැනීම සඳහා විවිධ තරාතිරමේ ගෙවල් දොරවල් සාදගනී. සාමාන්‍යයෙන් එක් ඉරියව්වක් එක් මොහොතකට වඩා කාලයක් නොපවත්නා නිතර සැලෙන අතිසූක්ෂම ජවබලයකින් යුත් මනස මුල්කොට පවත්නා ඉඳුරන් පිනවීම සඳහා උපයෝගී කරගන්නා විචිත්‍රාංග වෙනස් කරගනී. ඔහුගේ ජීවන යාත්‍රාව නිරුපද්‍රැතව පදවාගෙන යැම සඳහා අවශ්‍ය වන ආර්ථික සුරක්ෂිතභාවය සඳහා විවිධ තරාතිරමේ වෘත්තීන් සොයා යයි. තමාට පමණක් නොව තමන්ගෙන් පැවැතෙන පරම්පරාව පවත්වාගෙන යැම සඳහාද බලවත් වෙර වැයමක් දරයි. එහිදී සම්ප්‍රදායික ක්‍රමවලින් ඔබ්බට ගොස් නව ක්‍රියාමාර්ග සොයා ගැනීම සඳහා වැඩි වැඩියෙන් වෙර

දරයි. කාලාන්තරයක් තිස්සේ හුරුපුරුදු වූ සංස්කෘතික සමාජ රටාවක් ඇතුළත ජීවත්වන මිනිසා බැහැරින් පැමිණෙන නව ආකල්ප හා සංස්කෘතික අංග අනුකරණය කිරීමට පෙළඹෙයි. මිනිස් චින්තනයේ අසීමිත බල මහිමය මුල්කොට දිනෙන් දින සොයාගන්නා නවීන විද්‍යාත්මක අංග උපයෝගී කරගෙන යාන්ත්‍රික දියුණුවෙන් නිපදවුණු නවීන අංග වැඩිවැඩියෙන් උපයෝගී කරගැනීමට පෙළඹෙයි. මෙබඳු නවීකරණයක් හා නව නිෂ්පාදන මාධ්‍යයේ තරඟකාරී සමාජයක තරඟකාරී ලෝකයක ගැටෙමින් ඉමක් කොනක් නොපෙනෙන ප්‍රයත්නයක යෙදී සිටින මිනිසාගේ මුළු ජීවන රටාවම අනන්ත අප්‍රමාණ අතෘප්තිකර ස්වරූපයක් දරයි.

දසදිශාවෙන්ම පැමිණෙන නන්වැදෑරුම් බලවේගයන්ට හසුව තෘප්තියක් හෝ සැනසුමක් ලබාගැනීමේ අදහසින් පරදින සටනක යෙදී සිටින මිනිසා හා සමාජය වහ වහා වේගයෙන් නවාංග තම ජීවිතයට හා සමාජයට එක්රැස් කරගනී.

**වර්තමාන භික්ෂූන්වහන්සේ:**

ශ්‍රී ලංකාවේ ජනගහනයෙන් 85% ක් ම ජීවත්වන්නේ ගම්බදවය. මේ රටේ ගම්මාන 23,500 ක් පමණ වෙයි. 20,000 කට අධිකව සිටින ශ්‍රී ලංකාවාසී භික්ෂූන්වහන්සේලා අතරින් 18,000 ක් පමණ ජීවත්වන්නේද 85% ක් පමණ ජනතාව ජීවත්වන ගම්බද විහාරස්ථානවලය. 1971 සංස්කෘතික කටයුතු පිළිබඳ අමාත්‍යාංශයේ සංඛ්‍යාලේඛන වල විහාරස්ථාන 6172 ක් ද භික්ෂූන්වහන්සේලා 18,670 නමක්ද, ආරණ්‍ය සේනාසන 152 ක්ද, භික්ෂූන්වහන්සේලා 548 නමක්ද, ආරාම 184 ක්ද, දසසිල් මාතාවන් 413 දෙනෙක්ද, සිටින බව දක්වේ. රටේ සම්පූර්ණ ජනගහනයෙන් 3/4 ක්ම ජීවත්වන්නේ ගම් නියම්ගම් වලය. මේ තොරතුරු අනුව පෙනෙනුයේ ජනගහනයෙන් වැඩිදෙනා ගම්බදව ජීවත්වෙමින් ස්වකීය ජීවන යාත්‍රාව ගෙන යන බවයි. විවිධ දුෂ්කරතා මධ්‍යයේ රටේ ආර්ථික ප්‍රගතියට අතහිත දී කටයුතු කරන බහුතර ජනතාව අතර ජීවත්වන භික්ෂූන්වහන්සේ තරම් පොදු ජන ජීවිතයට ඉතා ලංව කටයුතු කරන එකම පුද්ගල කොටසක් හෝ සංස්ථාවක් නැතැ යි කීම සාවද්‍ය නොවේ. උන්වහන්සේට ජනතාවගේ අවශ්‍යතා, අරමුණු, සිතැඟි, ඔවුන්ට පෞද්ගලිකව හා පොදුවේ බලපාන ප්‍රශ්න හා දුෂ්කරතා පිළිබඳව ඉතා හොඳ අවබෝධයක් ඇතිවා පමණක් නොව එම දුෂ්කරතා නැතිකොට ඔවුන් ඉන් මුදවා, මානසික හා ආර්ථික දියුණුව කරා මෙහෙයවීමට තරම් ජනතා දයානුකම්පාවක්ද ඇත.

භික්ෂූන්වහන්සේගේ මෙම සමාජ සම්පර්කය අද ඊයේ ඇතිවූවක් නොවේ. එය මේරටේ බෞද්ධ සංස්කෘතිය ආරම්භ වූ ද සිටම පැවත එන්නකි. ගැමි ප්‍රදේශයත්, පන්සලත් අතර මේ සම්බන්ධය පැවතින. මහින්දගමනයෙන් පසු කිසියම් ජනාවාසයක් මේ රටේ කවද හෝ ඇතිවූවා නම් එද සිටම හෝ භික්ෂූන්වහන්සේගේ අනුශාසනා ලබාගැනීමට පන්සලක්ද ඇතිවිය. එද විහාරස්ථානයෙන් තොර ගමක් හෝ ගමෙන් තොර විහාරස්ථානයක් හෝ නොවූයේ යයි මේ රටේ ඓතිහාසික පුරාවිද්‍යාත්මක කැනීම් වලින් ලැබී ඇති තොරතුරු සහ මානව විද්‍යාත්මක තොරතුරු අනුව නිර්ණය කිරීමට පුළුවන.

සමානාත්මතාවෙන් ධෛර්යමත්ව ජනතා දයානුකම්පාවෙන් උණුසුම්ව පරාර්ථචර්යාවෙහි යෙදුණු භික්ෂූන්වහන්සේ මිනිස්කමේ යථා තත්වය ප්‍රත්‍යක්ෂ කරගෙන සිටියහ. උන්වහන්සේ සමාජ ප්‍රශ්න හා සමාජ ගැටුම් වලට ජනතාවත් සමග මුහුණ දෙමින් සමාජය තුළ සිටම විමුක්තිය ලබා ගැනීමට කටයුතු කළ උදර පුද්ගලයෙකි.

**සමාජය ආරක්ෂා කරගැනීමට විහාරස්ථානයෙන් ලැබෙන ප්‍රයෝජන:**

සමාජයේ සදචාර සම්පන්නභාවය ආරක්ෂා කරගැනීමට වස්ත්‍රද, ශරීර ශක්තිය වර්ධනය කරගැනීමට හා පවත්වා ගෙන යාමට ආහාරද, සුරක්ෂිතභාවයට ගෙවල් දොරවල්ද, සෞඛ්‍යය හා නිරෝගිබව ආරක්ෂා කරගැනීමට බෙහෙත් හේත්ද ලබාගැනීමට අවශ්‍ය අධ්‍යාපනය දිය හැකි පරිදි එද විහාරස්ථානයේ ස්වරූපය හා භික්ෂූන්වහන්සේගේ දැනුම සකස් වී තිබුණි. මෙම තත්වය අනුරපුර යුගයේ පටන් මහනුවර යුගය දක්වාම පැවතිනි. විශේෂයෙන් සඳහන් කරනවා නම් මේ තත්වය මෙරටට විදේශීය ආක්‍රමණයන් සිදුවීත් කලක් පැවතුණු අතර එම සමාජ සුරක්ෂිතභාවය සඳහා භික්ෂුවගේ සේවය ලැබීම මෙරට යටත් විජිතයක් බවට පත්කර ගැනීමෙන් පසු යටත්විජිතවාදීහු අඩපණ වන තැනට කටයුතු සැලැස්වූහ. ගමත් පන්සලත් අතර පැවැති ඉහත සඳහන් සම්බන්ධය අහෝසිවීමත් සමගම පුද්ගලයාත්, ගමත්, රටත් සදචාරාත්මක අංශයෙන් හා ආර්ථික වශයෙන්ද පිරිහීමට පටන්ගනී.

එද පොදුවේ සියළුදෙනාටම ආර්ථික, සමාජික, සදචාරාත්මක, ශාරීරික ආදී වශයෙන් සංවර්ධනයට ඉවහල්වන උපදෙස් ලැබුණි. සෑම තරාතිරමකම අයට සමාජ චාරිත්‍ර හා වාරිත්‍ර උගන්වන තැන ධර්මශාලාව විය. දහම් කියාදෙන දහම් පාසැල පන්සල විය. ගිහි සංස්ථාවට අවශ්‍ය ආවාහ විවාහ වලදී උපදෙස් දෙන ස්ථානය පන්සල විය. ඔවුන් ගේ මඟුල්, අවමඟුල්, කටයුතු වල දී පමණක් නොව විවාහය, කුසහොත් දරුවාට සෙත්පැතීම, ඉඳුල් කටගෑම, නම් තැබීම, අකුරු කියවීම, අධ්‍යාපනය දීම, මානසික හා කායික සෞඛ්‍යය හා නිරෝගී බව ආරක්ෂා වන පරිදි ජීවිත උපදෙස් දීම ආදී කුඩු මහත් කටයුතුවලදී පන්සලෙන්, භික්ෂූන්වහන්සේගෙන් ඉවත්වීම විශාල සමාජ පරිහානියකට හේතුවිය.

අනුරපුර, පොළොන්නරු, දඹදෙණි, කුරුණෑගල, කෝට්ටේ, මහනුවර ආදී සිංහල රාජධානි යුගවල භික්ෂූන්වහන්සේගේ සේවය හා දැනුම විවිධ ක්ෂේත්‍රයන්හි විහිදී පැතිරී පැවැතින. අහස උසට අදත් දිස්වන රන්මැලි මහා සෑයේ ඉංජිනේරු ධූර දැරුවේත්, සත්මහල් ලෝවා මහා ප්‍රාසාදයෙහි ගෘහ නිර්මාණ ශිල්පියා වූයේත්, භික්ෂූන්වහන්සේලා බව අපේ ජාතික ඉතිහාසය වන මහාවංශය කියයි. රටේ ජාතික අධ්‍යාපනය පැවතුනේ භික්ෂූන්වහන්සේ අතයි. රජකුමරාත්, ඇමති පුතාත්, ගම්දෙටුවාගේ පුතාත්, ගොවියාගේ පුතාත්, ගමේ සිටින කාගේ දරුවනුත් පන්සලේ එකට ඉඳගෙන සමානාත්මතාවාදී ක්‍රියා කලාපයන් මූර්තිමත් කරමින් භික්ෂූන්වහන්සේගෙන් අධ්‍යාපනය ලැබූහ. පාලකයා පාලන තන්ත්‍රයට අවශ්‍ය ශිල්ප ශාස්ත්‍ර උගත්තේ භික්ෂූන්වහන්සේගෙනි. ගණිත මිණිත තර්ක න්‍යාය වැනි ශාස්ත්‍රද, චිත්‍ර මූර්ති ආදී ලලිතකලාවන්ද, වාස්තු විද්‍යාව, වාරි කර්මාන්තය, නගර නිර්මාණ ශිල්පය වැනි විද්‍යා කර්මාන්තයන් ද, සාහිත්‍ය කරණයද භික්ෂූන්වහන්සේ අත පැවතින. මේ කිසිවක් රැකියාවක් ලෙස උන්වහන්සේ නොකළහ. සේවයක් ලෙස කළහ. ගිහි ජනතාවට ඉගැන්වූහ. භික්ෂූන්වහන්සේ සාහිත්‍යකරණය කළ අවදියේ අද මෙන් සාහිත්‍ය කෘති තුළින් ජනතාව වින්දනය කළේ කාමුක හැඟීම් ප්‍රකෝප කරවන ශෘංගාර රසය නොවේ. නව නාට්‍ය රසයන්ම එද සාහිත්‍යයන් වින්දනය කළහ. ජාතියට ජීවයක් දීමට, ජාතියටම විනයක් දීමට, ජාතියේම ආධ්‍යාත්මික සදචාරාත්මක හා ආර්ථික සංවර්ධනය සැලැසීමට උන්වහන්සේ මේවා උපයෝගී කරගත්හ. සංවර්ධනයේ කේන්ද්‍රස්ථානය පන්සල විය. ජාතික සංවර්ධනයේ මාර්ග දේශකයා භික්ෂූන්වහන්සේ වූහ.

## භික්ෂුවගේ සේවය අඩපණ වීම:

1815 මෙරට බ්‍රිතාන්‍ය යටත් විජිතයක් බවට පත්වීමත් සමගම භික්ෂූවගෙන් ඉටු වූ සේවය අඩපන වී ගියේය. සූක්ෂම සැලසුම් ක්‍රමවත්ව යෙදීමෙන් භික්ෂූන්වහන්සේත්, පන්සලත්, ජන ජීවිතයෙන් ඈත් කළහ. පන්සලෙන් වූ සේවය අඩපණ විය. පිරිවෙන් අධ්‍යාපනය සම්පූර්ණයෙන්ම වාගේ නැවතින. අධ්‍යාපනය සීමා සහිත විය. ගිහියාට ලබාදුන් අධ්‍යාපනයත් වෘත්තීය අධ්‍යාපනයක් වශයෙන් සීමා විය. එම නව වෘත්තීය අධ්‍යාපනයේද සමබරතාවක් නොවීය. එම අධ්‍යාපනයද සංස්කෘතික පදනමෙන් තොරව දුන්නක් නිසා අසාර්ථක විය. එහි ප්‍රතිඵලය වූයේ රටේ මංකොල්ලකෑම්, මිනීමැරුම්, වංචා දූෂණ ආදී සමාජයට අහිතකර සදචාර විරෝධී ක්‍රියාවන් වඩවඩාත් වර්ධනය වීමයි. භික්ෂූන්වහන්සේගෙන් අධ්‍යාපනය ගිලිහී යෑමත් සමගම ඇතිවූ අනිෂ්ට ප්‍රතිඵලයකි මේ. එහෙත් එතෙක් මෙරට පැවති බෞද්ධ සංස්කෘතික සරල ජීවන ක්‍රමය සංකීර්ණ සාටෝප සාඩම්බර ජීවිතයක් බවට පත්විය. චාන් කම නැති විය. මිනිසාට ජීවත්වීමට වඩා ඉන් එහා තත්වයක් ගැන සිතීමට අවස්ථාවක් නැති විය. එය ලාංකික සමාජයේ අහිත පිණිස, පිරිහීම පිණිස හේතු විය. නිදහස ලැබී දැනට වර්ෂ 30 කට ආසන්න වී ඇතත්, යථොක්ත තත්වයෙන් ඉවත්ව නැවතත් ශ්‍රී ලංකාව සදචාර සම්පන්න සංස්කෘතික පදනමකින් යුත් සරල ජීවිතයක් සඳහා පරිවර්තනය කිරීමට අපොහොසත් වී ඇත. මේ සඳහා වගකිවයුතු අය පවා මෙතෙක් දූරු ප්‍රයත්නයක් ගැන දැනගන්නට නැති බැවින් එබඳු ක්‍රමවත් වැඩපිළිවෙලක් සකස් කළයුතු කාලය දැන් උදා වී ඇත.

## භික්ෂුවගෙන් සමාජයට ලැබියයුතු සේවා:

1. සමාජයේ ආර්ථික සංවර්ධනය සමග සහගාමීව එමගින් පමණක් ලබාගන්නා මානසික තෘප්තිය හෙවත් සහනය වර්ධනයක් නොවේ. ඒ වෙනුවට සිදුවන්නේ මේ කරුණු දෙක අතර ප්‍රතිලෝම වර්ධනයකි. එනම් හුදු ආර්ථික සංවර්ධනයෙන් පමණක් මානසික අසහනය වැඩි වේ. භික්ෂූන්වහන්සේලාට සමාජයේ ආර්ථික සංවර්ධන ස්වරූපය අවබෝධ කරගෙන එයට සහගාමීව මානසික සහනය වර්ධනය කරගන්නා ආකාරය ගැන සමාජයට ක්‍රියාත්මක උපදෙස් දිය හැකිය.

2. මනුෂ්‍යයා සමාජගත සත්වයෙකු ලෙස පොදුවේ පිළිගෙන ඇත. ඔහුට තමාට පමණක් සීමා කරගත් බාහිර සමාජ සම්බන්ධතාවලින් තොරව, ලෞකික ජීවිතයක් ගත කිරීම බලවත් මානසික වදයක් වන අතරම ඔහුගේ මානසික ප්‍රගතිය අභිවෘද්ධිදයක අන්දමින් නොවැඩීමටද එය හේතුවේ. බග්ගවිසාන වැනි සූත්‍රවලින් ඉගැන්වෙන පවිවික්තභාවය වනාහි ලෞකික සමාජ සම්බන්ධතා මගින් වැඩුණු මනසක් ඇති පුද්ගලයාට පසුව එම සම්බන්ධතා අධ්‍යාත්ම විමුක්තියට බාධාවන අයුරින් ක්‍රියාකරන නිසා ඒවා අත්හැර දමා අනුපාදානව යථාර්ථය සාක්ෂාත් කරගැනීමට කරන උපදේශයක් බව සැලකිය යුතුය. එහෙත් මානසික ප්‍රගතියේ මූලික අවස්ථාවේදී සමාජ සම්බන්ධතා වර්ධනය කිරීම හැම මනුෂ්‍යයෙකුටම අනිවාර්යයෙන්ම අවශ්‍ය බව අප පිළිගත යුතුය. එමනිසා මේ කාර්යයෙහි ලා භික්ෂූන්වහන්සේට උදර සේවයක් කළ හැකි බව පැහැදිලිව පෙනීයයි. මිනිසුන් අතර දයාව, කරුණාව, සුරක්ෂිතභාවය වැනි සබඳතා දියුණුකර ගැනීමට කටයුතු සැලසීම භික්ෂූන් විසින් කළ යුත්තකි. සමාජ සම්බන්ධතාව වනාහි පුද්ගලයා තවත් පුද්ගලයන් සමගද, පුද්ගලයා සමාජය සමගද වශයෙන් ද්විවිධ වීමයි. දැනට බටහිර දිග සමාජයේ

ආර්ථික සංවර්ධනයක් දක්නට ඇතත් සමාජ සම්බන්ධතාව බෙහෙවින් පෞද්ගලිකත්වයට පටුවී ගොස් ඇති නිසා ඔවුන්ට බලවත් මානසික ප්‍රශ්න මතුවිය. එහෙත් ලක්දිව පන්සල කේන්ද්‍රකොට පෞද්ගලිකත්වයට පමණක් අවතීර්ණ වූ සමාජ සම්බන්ධතාව පොදු සමාජ සම්බන්ධතාවකට දියුණු කළ හැක්කේ භික්ෂුවටය.

3. සමාජගත සහ සන්තානගත ගැටළුවලින් වැඩි ප්‍රමාණයක් ඇතිවී තිබෙන්නේ පුද්ගලයාගේ දෘෂ්ටියේ ඇති සාවද්‍යතාව නිසා බව පැහැදිලිය. මේ නිසා කවර සංකල්පයක්, දර්ශනයක්, සිද්ධාන්තයක්, සමාජ චාරිත්‍රයක් ගැන වුවද අන්තභජනය නොකෙරෙන හැමවිටම සත්‍යයට ළඟාවන මධ්‍යම ප්‍රතිපදවෙහි ප්‍රතිපන්න වූ සම්මා දිට්ඨියක් ඇතිකර ගැනීම සඳහා පුද්ගලයාගේ සහ පොදුවේ සමාජයේ මානසික ආකල්පයන් දියුණු කිරීම සඳහා භික්ෂුව ව්‍යාවෘත විය හැකිය.

4. කවර රටක හෝ ආර්ථික ප්‍රගතියෙහි නොයෙක් අඩුපාඩුකම් දක්නට ලැබේ. ආර්ථික ප්‍රගතිය කිසියම් තෘප්තිදයක සහ ප්‍රතිඵලදයක තත්වයකට ප්‍රතිසංවිධානය කරනුවස් ආර්ථික දර්ශනයක් ද තිබිය යුතුය. ඡන්ද, ද්වේෂ, භය, මොහ ආදී අහිතකර ප්‍රවණතාවලින් බැහැර වූ සම්මා වාචා, සම්මා කම්මන්ත, සම්මා ආජීව යන බෞද්ධ සංකල්ප වලින් ඉගැන්වෙන යථාර්ථවාදී ආර්ථික දර්ශනයක් සමාජයට දීමට භික්ෂූන්වහන්සේලා කටයුතු කළ හැකිය.

5. අද සමාජයේ බොහෝ දෙනෙකු අරමුණ ලෙස සලකා ගන්නා ආර්ථික හා මානසික සංවර්ධනය මනුෂ්‍යයාගේ නිෂ්ඨාව හැටියට බෞද්ධ දර්ශනය අනුව පිළිගත නොහැක. මනුෂ්‍යයාගේ සදචාර ජීවිතය ක්‍රමානුකූලව වර්ධනය වී පුද්ගලයා ශ්‍රෙෂ්ඨත්වයකට පත් කරවීම බෞද්ධ දර්ශනය අනුව පුද්ගලයාගේ පුරුෂාර්ථය විය යුතුය. එම පුරුෂාර්ථය කරා පුද්ගලයා යොමුකරවීම ශීල, සමාධි, පඤ්ඤා යන ත්‍රිවිධ ශික්ෂාව මගින් උගන්වා ඇත. පුද්ගලයාගේ සදචාරාත්මක පරිපූර්ණත්වය ශීලයෙනුත් මානසික ස්ථාවරභාවය සමාධියෙනුත් දක්වා ඇති අතර, මනුෂ්‍යයාගේ පරම නිමාව, 'පඤ්ඤා' යනුවෙන් පෙන්වා ඇත. මනුෂ්‍යයාගේ ජීවිත පරමාර්ථය කුමක්දැයි නොදැනීම නිසා වික්ෂේපයට පත්ව සිටින සමස්ත මානව ප්‍රජාවටම පැහැදිලි ජීවිත පරමාර්ථයක් හෙවත් පුරුෂාර්ථයක් ඇතිබවක් එය ප්‍රබුද්ධ සිහියෙකින් යුක්තව කට යුතු කරන පුද්ගලයාට ත්‍රිවිධ ශික්ෂාව තුළින් සාක්ෂාත් කළ හැකි බවත් පැහැදිලි කරදීමෙන් සමාජයට විශිෂ්ටතම සේවය සපුරාදීමද භික්ෂූන්වහන්සේට කළහැකිය.

භික්ෂුවට සමාජයේ හිමිතැන සුරක්ෂිතවන්නේත්, භික්ෂුව සමාජයෙන් වෙන්කළ නොහැකි අංගයක් වශයෙන් සැලකිය හැක්කේත් මෙම සේවාවන් ඉටුවන්නේ නම් පමණි. නමුත් එම සේවාවන් සඳහා භික්ෂූන්වහන්සේලා ප්‍රවීණත්වය ලබා ඇත්දැයි යන්න සැකයකි. ඉහත කී සේවාවන් ඉටුකර දීමට හැකිවන තත්ත්වයේ අධ්‍යාපන ක්‍රමයක් තරුණ භික්ෂු පරපුරට ලබාදිය යුතු අතර, දැනට පිරිහීගොස් ඇති පැරණි ගුරු–ශිෂ්‍ය සම්බන්ධතාවය යළිත් පුනරුත්ථාපනය කොට එම ශික්ෂණ සම්ප්‍රදයෙන් ලද හැකි උපරිම ප්‍රයෝජනයද ගත යුතු ය. භික්ෂු සමාජයට තිබිය යුතු මේ නව පුරුෂාර්ථයන් සඵල කරගැනීම අරමුණු කරගත්තාවූ අධ්‍යාපන ආයතන පිහිටුවීම දැන් සලකාබැලිය යුතු කරුණක් බවද සඳහන් විය යුතුය.

**භික්ෂු සේවා පණගැන්වීම:**

මහින්දගමනයේ පටන් මේ දක්වාමත් උරුමව තිබූ භික්ෂු නායකත්වයෙන් වත්මන් ලාංකික සමාජයට අවශ්‍ය සේවය ලබාදීමට පහසුකම් සලසාගත යුතුය. භික්ෂූත්වයට පත්වූ ද පටන් ගම්බද ජනතාවගේ සදචාර සංස්කෘතික, ආර්ථික, අධ්‍යාපනික හා දේශපාලනමය වූ නායකත්වයට භික්ෂූන්වහන්සේ අනිවාර්යයෙන්ම පත්වෙයි. මෙම නායකත්වය හරි හැටි ක්‍රියාත්මක කිරීම තරම් දැනුමක් විදේශීන් මෙරට ඇතිකළ නව වෘත්තීය අධ්‍යාපන ක්‍රමය නිසා ලබාගත නොහැකිය. ප්‍රථම වශයෙන් භික්ෂූන්වහන්සේගේ සේවය ජාතියේ ඉදිරිගමනට ලබාගැනීමට නම් භික්ෂු අධ්‍යාපනය හෙවත් පිරිවෙන් අධ්‍යාපනය වර්තමානයට උචිත පරිදි සකස් කළ යුතුය. එසේ අධ්‍යාපනය සකස් කළොත් උන්වහන්සේට ශ්‍රමන සාරූප්‍ය ගුණාංගයන්ද ආරක්ෂා කරගෙන ලක්ෂ සංඛ්‍යාත ග්‍රාමීය ජනතාවගේ සදචාර, සංස්කෘතික හා ආර්ථික සංවර්ධනය සඳහා අපරිමිත සේවයක් ඉටුකළ හැකි වෙයි. බෞද්ධ සංවර්ධන ආකල්පත් නවීන විද්‍යාත්මක සංවර්ධන ආකල්පත් පිළිබඳ දැනුමක් මේ සඳහා අවශ්‍යය. එම අධ්‍යාපනය ශ්‍රී ලංකාවේ සංස්කෘතික පදනම මත පිහිටා දිය යුත්තකි.

බුද්ධ ධර්මය, බෞද්ධ සංස්කෘතිය හා විනයත් භික්ෂු අධ්‍යාපනයේදී අනිවාර්ය වියයුතු. ඒ සමගම ආර්ථික විද්‍යාව, සමාජ විද්‍යාව, මනෝ විද්‍යාව, දේශපාලන දර්ශන, නීති-විද්‍යාව වැනි විෂයයන්ද ඉගැන්විය යුතුය. මෙතෙක් මේ සඳහා ක්‍රමවත් වැඩ පිළිවෙලක් නැත. කොටින්ම කියතොත් භික්ෂුවගේ සේවය ජාතියේ සෞභාග්‍යය සඳහා ලබා ගැනීමට අවශ්‍ය අධ්‍යාපනය දීම සඳහා වෙනම භික්ෂු විශ්වවිද්‍යාලයක් ආරම්භ කළ යුතුව ඇත.

මෙහි අවශ්‍යතාව වඩාත් කැපී පෙනෙන්නේ පිරිවෙන් විශ්වවිද්‍යාල ගැන සිතා බැලීමෙනි. පිරිවෙන් විශ්වවිද්‍යාල පිහිටුවන ලද්දේ එතෙක් විද්‍යෝදය හා විද්‍යාලංකාර පිරිවෙන් දෙකෙන් ඉටුකළ අධ්‍යාපනය තව තවත් වඩා වර්ධනය කර බෞද්ධ අධ්‍යාපන ක්‍රමය දියුණුකොට, මේ රටේ ජාතියේ දියුණුවට අදළ වන උගතුන් පිරිසක් බිහි කිරීමටය. එතෙක් මේ කාර්යය එම මහ පිරිවෙන් දෙකෙන් ඉටුවින. එහෙත් පිරිවෙන් විශ්ව විද්‍යාල බවට පත්වීමත් සමගම එය සම්පූර්ණයෙන්ම වෙනත් අතකට යොමුවිය. එය ජාතියේ ප්‍රගතියට වඩා ජාතියේ මෙන්ම භික්ෂු සංස්ථාවේද පරිහානියට හේතු වූ බව නොකියාම බැරිය. පූජ්‍ය වැලිවිටියේ සෝරත නාහිමිපාණන් වැනි කිහිප දෙනෙකු මේ සඳහා දැඩි ප්‍රයත්නයක් දැරුවද, එය මල්ඵල ගන්වාලිය නොහැකි විය.

වර්තමාන තරුණ භික්ෂුව මංමුලාවූ තත්වයක සිටී. විශ්වවිද්‍යාල අධ්‍යාපනය ලබන භික්ෂූන්වහන්සේත් ගිහියාත් අතර වෙනසක් නොමැත. දෙදෙනාම හදරණ විෂයමාලාව එකකි. දෙදෙනාටම ඇති අරමුණුද එකකි. මේ දෙදෙනාගෙන්ම සමාජයට සේවයක් වෙයිද? උසස් අධ්‍යාපනය ලබන භික්ෂූන්වහන්සේලා අතරෙන් බුද්ධ ධර්මය, පාළි, සංස්කෘත, බෞද්ධ සංස්කෘතිය වැනි විෂයයන් හදරන්නේ කීදෙනාද? භික්ෂූන්වහන්සේලා ආර්ථික විද්‍යාව, භූගෝලය, ඉතිහාසය, දේශපාලන විද්‍යාව, වාණිජ විද්‍යාව වැනි විෂයයන් කරා යොමුවන්නේ ඇයි? එම අධ්‍යාපනයෙන් උපාධිය ලැබූ තරුණ භික්ෂුව යන්නේ කොහේද? උන්වහන්සේගේ අරමුණ කුමක්ද? ගිහි උපාධිධරයා මෙන්ම උන්වහන්සේත් රැකියාවක් අපේක්ෂා කරති. පාළි, සංස්කෘත, බුද්ධ ධර්මය හදරා රැකියාවක් ලබාගත නොහැකියි. එම විෂයයන් හදරා සිවුරු නොහැර සිටියත් වැඩක් නැත. වෙනත් සේවයක් කිරීමටත් පහසුකම් නැත. මේ සඳහා අද වගකියයුත්තන්ගේ පවා ප්‍රසාදයට

හා අනුමැතියට පත්වී ඇති ආර්ථිකමය වටිනාකමක් ඇති විෂයයන් හැදෑරිය යුතුය. හදරා උපැවැදිව රැකියාවක් ලබාගත යුතුය. මේ තත්ත්වය කෙරෙහි අවධානය යොමුකළ අය ඉතා හිහය.

භික්ෂූන්වහන්සේගේ සේවය ජනතාවට හරිහැටි ලබාදීමට නම් භික්ෂු අධ්‍යාපනය ක්‍රමවත් කළ යුතුය. අධ්‍යාපනයෙන් පසු උන්වහන්සේගේ සේවය ජාතියේ සංවර්ධනයට ලබාදීමට ක්‍රමවත් වැඩ පිළිවෙලක් අවශ්‍යය. තම දියුණුවත්, සමාජ දියුණුවත් දෙකම සැලසෙන වැඩ පිළිවෙලක් අවශ්‍යය. එමනිසා භික්ෂු අධ්‍යාපනය ගිහි අධ්‍යාපනයට වඩා පුළුල් විය යුතුය. උන්වහන්සේට ධර්මයෙන් හා අර්ථයෙන් යන අංශ දෙකින්ම සංවර්ධනයට හේතුවන අධ්‍යාපනයක් දිය යුතුය. බුද්ධ ධර්මය, බෞද්ධ සංස්කෘතිය, විනය, ඉතිහාසය වැනි විෂයයන්ට වගේම සංවර්ධනය, ආර්ථික විද්‍යාව, සමාජ විද්‍යාව, වැනි නූතන අර්ථක්‍රමයට අදළ විෂයයන් පිළිබඳ අධ්‍යාපනයක් ලබාදිය යුතුය. එසේ කළොත් පමණී ජාතියේ සංවර්ධනය ඇතිවන්නේ. වෙනස්වන සමාජයේ භික්ෂුවට අයත් කාර්යභාරය ඉටුකළ හැක්කේ එවිටය.

---

* 1977 ශ්‍රී සෝරත අනුස්මරණ දේශනයක්.